## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා සුරාබදු | යොමු අංකය<br>දිනය | : EB/102/අති.සු.කො.ජ./2016<br>: 2017.01.23 |
| 1.2 | අමාත්‍යාංශය : මුදල් හා ජනමාධ්‍ය | යොමු අංකය<br>දිනය | : MF1/22/Com/EXC<br>: 2017.03.16 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය<br>දිනය | : DMS/1175/111<br>: 2016.07.27 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය<br>දිනය | : EST-2/04/REC/10105<br>: 2017.08.14 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය<br>දිනය | : NSCC/3/2/14/SR-2<br>: 2017.04.26<br>2017.06.23 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය<br>දිනය | : PSC/EST/05-01-02/01/2018<br>: 2018.08.28 |

**02. පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : ජ්‍යෙෂ්ඨ විධායක

3.2 ශ්‍රේණි : විශේෂ

3.3 **පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :**

සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන අදාල ආඥාපනත්, අණපනත් හා වෙනත් නියෝග යටතේ නීත්‍යානුකූල සුරා ප්‍රමිති කිරීම් වලින් ලැබිය යුතු සුරාබදු එකතු කිරීම් හා අනවසර සුරා/මත්ද්‍රව්‍ය වැළැක්වීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, විධානය හා තීරණ ගැනීමේ කාර්යයට දෙපාර්තමේන්තු ප්‍රධානියාට සම්බන්ධ වීම.

3.4. **කාර්යයන් පැවරීම** :-

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

05. වැටුප්

5.1 වැටුප් කේතය : SL 03 – 2016

5.2 මාසික වැටුප් ප්‍රමාණය : රු. 88,000 - 12 X 2700 - 120,400

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | 01 | 88,000/- |

සටහන :- වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානයන්ට අනුකූල වේ.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්) | විශේෂ | 01 | අභිමතානුසාරී බලය හිමිවන්නා වූ ද, ප්‍රතිපත්ති සම්පාදනය, විධානය හා තීරණ ගැනීමේ කාර්යයට සෘජුවම ඇතුළත් වන්නා වූ ද, කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි. |

6.2 තනතුරු : 01

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතයන් |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2. විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3. සීමිත බඳවා ගැනීම :

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය: විශේෂ

7.3.2. **සුදුසුකම්**

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම්:-

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කළමනාකරණය, ආර්ථික, සමාජ සංවර්ධන, නීතිය, රසායන විද්‍යාව, බදුකරණය යන විෂය ක්ෂේත්‍රයේ, කවර හෝ විෂයකට අදාළව ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම්: අදාළ නොවේ

7.3.2.3. පළපුරුද්ද :

(i) උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයට අයත් දෙපාර්තමේන්තුගත තනතුරක/තනතුරුවල වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii.) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ දෙපාර්තමේන්තුගත තනතුරක/තනතුරුවල පළමු ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක 5 ක් උපයාගෙන තිබීම.

7.3.2.4. කායික සුදුසුකම් : ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් :

(i.) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii.) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

(iii.) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම

(iv.) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

(v.) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

7.3.3. වයස : අදාළ නොවේ

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්

7.3.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.3.4.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| අනු අංකය | පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | සේවා පළපුරුද්ද (පළමු ශ්‍රේණියේ වසර 5ට අමතරව ඇති සේවා කාලය) | 25 | අදාල නොවේ |
| 2 | අධ්‍යාපන සුදුසුකම් (ඉල්ලා ඇති සුදුසුකමට අමතරව ඇති පශ්චාත් උපාධි සඳහා) | 30 | |
| 3 | අදාල දිනට පූර්වාසන්න වසර 05 තුල ලබාගත් වෘත්තීය සුදුසුකම් හා දේශීය හෝ විදේශීය සති 2ට නොඅඩු පාඨමාලා, පුහුණු හා වැඩමුළු ආදිය සඳහා | 20 | |
| 4 | වෙනත් සුදුසුකම් - අදාල දිනට පූර්වාසන්න වසර 05 තුල තොරතුරු තාක්ෂණය හා භාෂා හැකියාව වැනි වෙනත් සහතික | 20 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |

7.3.4.3.1 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සටහන :

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත. විස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුලත් කළ යුතුයි.

2. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණු වල එකතුවේ කුසලතාවයේ අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගනු ලැබේ.

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**08.** කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ

**09.** භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ

**10.** ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ

**11.** තනතුරු වලට පත්කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ **කොන්දේසි :** අදාළ නොවේ.

13. **සක්‍රීය සේවා කාලයට අදාළ අර්ථ දැක්වීම 2015.09.17 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2014 (II) අනුව**

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ".

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :** අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කලේ : අත්සන ................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ඒ.එච්.එම්.එස්.පී. අබේසිංහ
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2018.12. 18

පරීක්ෂා කලේ : අත්සන ........................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : බුද්ධික වෙහෙරගොඩ
තනතුර : සුරාබදු කොමසාරිස් (පාලන හා මානව සම්පත්)
දිනය : 2018.12.

නිර්දේශ කර ඉදිරිපත් කරමි
අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
තනතුර : සුරාබදු කොමසාරිස් ජනරාල්
දිනය : 2018.12. 21
නිලමුද්‍රාව

ආර්. සේමසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

යොමු අංකය : MF1/22/Com/EXC

2018.08.28 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන

නම

ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග
ලේකම්
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 01,
ශ්‍රී ලංකාව.

ලේකම්

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

දිනය : 2018.12.31

නිල මුද්‍රාව ..........................................

---

යොමු අංකය : PSC/EST/05-01-02/01/2018

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2018.08.28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන

නම එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

දිනය : 2019/01/23

නිල මුද්‍රාව ..........................................